## වෘත්තීය පුහුණුලාභීන්ගේ වර්තමාන රැකියා තත්ත්වයන් පසුවිපරම් කිරීමේ අධ්‍යයනය

වෘත්තීය පුහුණුලාභීන්ගේ රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන වෘත්තීය පුහුණු වැඩසටහන් ඵලදායීව ඇගයීමට ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහාය ඇතිව නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇත. මේ සඳහා මෙම වෘත්තීය පුහුණු උපාධිධාරීන්ගේ වර්තමාන රැකියා තත්ත්වයන් සහ ඒ සඳහා වෘත්තීය පුහුණු පාඨමාලාවේ දායකත්වය මෙන්ම අදාළත්වය අවබෝධ කර ගැනීම සහ පුහුණු පාඨමාලා වැඩිදියුණු කිරීම සඳහා යම් ප්‍රතිපෝෂණයක් ලබා ගැනීම සඳහා වෘත්තීය පුහුණුලාභීන්ගෙන් තොරතුරු රැස් කිරීම අවශ්‍යව ඇත. මෙම අරමුණු ඇතිව පසුවිපරම් සමීක්ෂණයන් සිදු කිරීමට නිල වශයෙන් තීරණය කර ඇති අතර එම අධ්‍යයනය සිදු කිරීම සඳහා දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) සම්බන්ධ වී ඇත.

එහිදී 2016 සහ 2019 වර්ෂයන් තුළ CEPA ආයතනය විසින් පසුවිපරම් අධ්‍යයන දෙකක් දැනට සිදු කර ඇත. එම එක් එක් අධ්‍යයනයන් සඳහා වෘත්තීය පුහුණු උපාධිධාරීන් 2100 බැගින් සමීක්ෂණය කර ඇත. මෙහි තුන්වන පසුවිපරම් අධ්‍යයනය සඳහා වූ සමීක්ෂණය 2020 වසරේ දී CEPA ආයතනය විසින් සිදු කිරීමට නියමිතය.

2018 ජනවාරි මස 31 වන දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා කාලය තුළ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරූ අහඹු ලෙස තෝරාගත් වෘත්තීය පුහුණුලාභීන් වෙත 2020 නොවැම්බර් සහ දෙසැම්බර් කාලය තුළ CEPA ආයතනයේ සමීක්ෂණ නිලධාරීන්ගෙන් දුරකථන ඇමතුමක් ලැබෙනු ඇත. එහිදී වෘත්තීය පුහුණු පාඨමාලා සම්බන්ධව ඔබගේ අදහස් සහ අත්දැකීම් පිළිබඳව විමසනු ඇත

මෙම සමීක්ෂණය සඳහා ඔබව අහඹු ලෙස තෝරාගෙන තිබේනම්, ඒ සඳහා සහභාගි වීමට ඔබගේ කාලය ගතකරන මෙන් ඉල්ලා සිටිමු.  මෙය නිල සමීක්ෂණයක් වන අතර වෘත්තීය පුහුණු වැඩසටහන් සහ එහි ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා ඔබගේ ප්‍රතිචාර අපට ඉතා වැදගත් වේ. සමීක්ෂණය මගින් රැස් කරන ලද සියළු තොරතුරු වල රහසිගතභාවය ආරක්‍ෂා කරනු ලබන අතර පුද්ගල ප්‍රතිචාරයන්ගේ නිර්ණාමිකත්වය ද ආරක්ෂා කරනු ඇත. මේ පිළිබඳව යම් පැහැදිලි කිරීමක් හෝ විමසීමට අවශ්‍ය නම් පහත දුරකථන අංකයෙන් CEPA ආයතනය අමතන්න.

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)**

**දුරකථන අංක  077 8863350**